# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## ඉඩම් අමාත්‍යාංශය

## අභ්‍යන්තර විගණක තනතුර සඳහා ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩුව පවතින කළමනාකාර සේවා ශ්‍රේණියෙහි අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. තනතුර** : අභ්‍යන්තර විගණක

1.1. තනතුරු සංඛ්‍යාව : 01

**2. වැටුප් පරිමාණය** : **53175/- 1375x10-1910x15-95575/=**

2.1 මාසික මූලික වැටුප : 53175/=

**3. වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**4. සුදුසුකම්**

4.1 බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ්‍ය පිළිබඳ ප්‍රථම උපාධිය

**හෝ**

වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ පිරිවැය හා කළමනාකාරීත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) අන්තර් මධ්‍යම මට්ටම සමත්වීම

**සහ**

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු පිළිබඳ වසර තුන (03) ක පළපුරුද්ද

4.2 අභ්‍යන්තර අයදුම්කරුවන්

කතිෂ්ඨ කළමනාකරණ සේවා ශ්‍රේණියේ I ශ්‍රේණියේ ගිණුම් නිලධාරි තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් ලබාතිබීම

5. ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රයක් අදාළ සහතිකවල පිටපත් ද සහිතව 2021.05.04 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

6. සියලුම අයදුම්කරුවන්ගේ විස්තර ලුහුඬු ලැයිස්තු ගත කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7. රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව තෝරාගත හොත් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය.

8. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

**සභාපති,**
**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,**
**අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.**
**2021.04.19**